ISSUE 14
DECEMBER 2025

# CYBER GUARDIAN

Publication for your online safety

## අන්තර්ජාල හිරිහැර හා වංචා පිළිබඳව විමසිල්ලෙන් සිටින ලෙස Sri Lanka CERT මහජනතාවගෙන් ඉල්ලා සිටී

සයිබර් ආරක්ෂාව පිලිබඳ සිද්ධීන් සහ සමාජ මාධ්‍ය අනිසි භාවිතය සම්බන්ධයෙන් Sri Lanka CERT වෙත 2025 වසරේදී පැමිණිලි 12650 කට වඩා ලැබී තිබේ. පැමිණිලිවලින් සැලකිය යුතු ප්‍රතිශතයක් ව්‍යාජ ගිණුම්, ගිණුම් සඳහා අනවසරයෙන් ප්‍රවේශවීම් සහ සමාජ මාධ්‍ය වේදිකා හරහා සිදු කරන ලද මූල්‍ය වංචා සම්බන්ධයෙන් වූ ඒවා වේ.

Sri Lanka CERT හි ප්‍රධාන තොරතුරු ආරක්ෂක ඉංජිනේරු චාරුක දමුණුපොල මහතා සඳහන් කරන්නේ වෛරී හෝ අනර්ථකාරී අන්තර්ගතයන් සහ වැඩිහිටියන්ට අදාල ලිංගික හිරිහැර පිළිබඳ අන්තර්ගතයන් ද පැමිණිලි අතර ඉහළ මට්ටමක පවතින බවයි. පුද්ගලිකව මෙන්ම සාමාන්‍ය ජනතාවට ද බලපාන අන්දමේ සාමාන්‍ය ස්වරූපයේ වංචා සහ අසත්‍ය තොරතුරු බෙදා හැරීමේ ද කැපී පෙනෙන වැඩිවීමක් ඒ අතර දක්නට ලැබෙන බව ඔහු පැවසීය.




අන්තර්ජාලය තුල සුපරීක්ෂාකාරීව සිටින ලෙසත්, පුද්ගලික හෝ මූල්‍ය තොරතුරු අන්තර්ජාලය ඔස්සේ බෙදා ගැනීමෙන් වළකින ලෙසත්, සැක සහිත පණිවිඩ සහ සබැඳි සත්‍යාපනය (verify) කරන ලෙසත්, ද්වි-සාධක සත්‍යාපනය (Two factor authentication) සහ ආරක්ෂිත මුරපද වැනි ශක්තිමත් ආරක්ෂක පියවරයන් සක්‍රීය කරන ලෙසත් චාරුක දමුණුපොල මහතා මහජනතාවගෙන් ඉල්ලා සිටී.

කඩිනම් ප්‍රතිචාර සැලසීම පහසු කිරීමටත්, අවදානම අඩු කිරීම සඳහාත් සයිබර් ආරක්ෂාව සම්බන්ධයෙන් වන සිද්ධීන් හැකි ඉක්මනින්ම Sri Lanka CERT වෙත වාර්තාකරණ ලෙස මහජනතාවට දැනුම් දෙනු ලැබේ.

## සයිබර් අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය අපරානුමත කිරීම පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ පළමු සැසිය

සයිබර් අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය අපරානුමත කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන යන වැඩපිළිවෙළ පිළිබදව පාර්ශ්වකරුවන්ගේ අදහස් ලබාගැනීමේ අරමුණින් පාර්ශ්වකරුවන්ගේ පළමු උපදේශන සැසිය ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ Sri Lanka CERT ආයතනය පසුගිය දෙසැම්බර් මාසයේදී පවත්වන ලදී.

විදේශ කටයුතු අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා පොලිසිය යන ආයතනවල නිලධාරීන් සහභාගී වූ පාර්ශ්වකරුවන්ගේ උපදේශන රැස්වීමේ මුලසුන හොබවන ලද්දේ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ වැඩබලන ලේකම් වරුණ ශ්‍රී ධනපාල මහතා විසිනි.

රැස්වීම ආරම්භයේදී Sri Lanka CERT සභාපති තිලක් පතිරගේ මහතා, රැස්වීමට පැමිණි සියලු දෙනා සාදරයෙන් පිළිගත් අතරSri Lanka CERT නීති සහ නියාමන කටයුතු අංශයේ කළමනාකාර චමිලා සේනානායක මහත්මිය පාර්ශවකරුවන්ගේ අදහස් දැක්වීම් සැසිය මෙහෙයවූවාය.

ජ්‍යෙෂ්ඨ නීතිඥ ජයන්ත ප්‍රනාන්දු මහතා සයිබර් අපරාධ පිළිබඳ ජාත්‍යන්තර නීති රාමු වල විකාශය සහ ශ්‍රී ලංකාවේ නීතිමය සහ නියාමන ක්ෂේත්‍රය කෙරෙහි ඒවායේ බලපෑම පිළිබඳව තාක්ෂණික සහ නීතිමය තත්ත්වය ඉදිරිපත් කළේය. නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතිඥ සෙහාන් සොයිසා මහතා විසින් සයිබර් අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ එය ශ්‍රී ලංකාවේ වත්මන් නීති රාමුව සමඟ ඒකාබද්ධ කළ හැකි ආකාරය පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සපයන ලදී.



## ජාතික විගණන කාර්යාලය සඳහා සිව් දින සයිබර් ආරක්ෂණ විගණන පුහුණුවක්

ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (CERT) විසින් රාජ්‍ය ආයතනවල සයිබර් ආරක්ෂණ මූලපිරීම් විගණනය කිරීම පිළිබඳව ජාතික විගණන කාර්යාලයේ ජාතික විගණන නිලධාරීන් සඳහා දින හතරක පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.



එසේම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද රාජ්‍ය ආයතන සඳහා වන තොරතුරු හා සයිබර් ආරක්ෂණ පද්ධතිය රාජ්‍ය ආයතන තුළ ක්‍රියාත්මක වීම අධීක්ෂණය සඳහා ජාතික විගණන ආයතනයේ නිලධාරීන් පුහුණු කිරීම එහි අරමුණ විය. රජයේ සේවාවන්හි ඩිජිටල් පද්ධති වර්ධනය වන කාර්යභාරයක් ඉටු කිරීමත් සමඟ, සයිබර් ආරක්ෂාව සඳහා වෙන් කර ඇති රාජ්‍ය අරමුදල් ශක්තිමත් අධීක්ෂණය, වගවීම සහ ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කිරීමට මෙමගින් අපේක්ෂා කෙරේ.

## Sri Lanka CERT මාධ්‍ය වෘත්තිකයන් සඳහා සයිබර් ආරක්ෂණ වැඩමුළුවක් පවත්වයි

මුද්‍රිත, විද්‍යුත් සහ ඩිජිටල් මාධ්‍ය ආයතන නියෝජනය කරන මාධ්‍යවේදීන් 35 කට අධික සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් "මාධ්‍ය වෘත්තිකයන් සඳහා ඩිජිටල් යුගයක සයිබර් තර්ජනවලට මුහුණ දීම" යන මැයෙන් වූ එක්දින වැඩමුළුවක් Sri Lanka CERT විසින් පසුගිය දෙසැම්බර් මාසයේදී කොළඹ SLIDA ශ්‍රවණාගාරයේදී සාර්ථකව පවත්වන ලදී.

ඉතා සංකීර්ණ ඩිජිටල් පරිසරයක් තුළ නැගී එන සයිබර් තර්ජන, ඩිජිටල් ආරක්ෂාව සහ වගකිවයුතු වාර්තාකරණය පිළිබඳ මාධ්‍යවේදීන්ගේ අවබෝධය ශක්තිමත් කිරීම මෙම වැඩමුළුවේ අරමුණ විය. සයිබර් අපරාධ ප්‍රවණතා,මාර්ගගත ආරක්ෂණ අවදානම්, දුස් තොරතුරු සහ සයිබර් ආරක්ෂණ දැනුවත්භාවය සඳහා මාධ්‍යයේ කාර්යභාරය යන මාතෘකා ආවරණය කරමින් ක්‍රියාකාරී සැසි කිහිපයක් එහිදී සහභාගීව න්නන් සඳහා පැවැත්විණි.

මෙම අවස්ථාවට සහභාගී වූ, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ වැඩබලන ලේකම් වරුණ ශ්‍රී ධනපාල මහතා, වැඩමුළුව සාර්ථකව නිම කළ මාධ්‍ය වෘත්තිකයන්ට සහතික පත් ප්‍රදානය කළේය. ශ්‍රී ලංකාවේ ඩිජිටල් පරිවර්තන ක්‍රියාදාමයේදී මහජන දැනුවත්භාවය වර්ධනය කිරීමේදී මාධ්‍ය වෘත්තිකයන්ගේ තීරණාත්මක කාර්යභාරය හෙතෙම සිය අදහස් දැක්වීමේදී ඉස්මතු කර දැක්වීය.

## උත්සව සමය සහ ආපදා ආශ්‍රිත සමාජ මාධ්‍ය වංචා ඉහළ යාම පිළිබඳව Sri Lanka CERT මහජනතාවට අනතුරු අඟවයි




පසුගිය දිනවලදී සමාජ මාධ්‍ය වේදිකා හරහා මාර්ගගත වංචා සහ මුදල් වංචා කිරීමේ උත්සාහයන් වැඩිවීමක් දක්නට ලැබෙන බැවින්, අතිශයින්ම සුපරීක්ෂාකාරීව සිටින ලෙස ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (Sri Lanka CERT) මහජනතාවගෙන් ඉල්ලා සිටී. මෙම සයිබර් අපරාධකරුවන් උත්සව සමය හා පවතින දේශගුණික විපර්යාස තත්ත්වයන් ප්‍රයෝජනයට ගනිමින් මහජන විශ්වාසය සහ කාලගුණික අවදානම ගසාකෑමේ උත්සාහයක නිරතව සිටින බවද නිරීක්ෂණය කර ඇත.

මෙලෙස රාජ්‍ය ආයතන, රාජ්‍ය සේවා දෙපාර්තමේන්තු, සුපිරි වෙළඳසැල් සහ ප්‍රසිද්ධ ව්‍යාපාරික ආයතන ලෙස ව්‍යාජ ලෙස පෙනී සිටින වංචනිකයන් සම්බන්ධයෙන් Sri Lanka CERT වෙත සැලකිය යුතු පැමිණිලි සංඛ්‍යාවක් ලැබී තිබේ. මෙම වංචනිකයන් සැකයක් ඇති නොවන පරිදි පුද්ගලයින් නොමඟ යැවීම සඳහා ව්‍යාජ දීමනා, මූල්‍ය ත්‍යාග සහ ත්‍යාග ලබා දෙන බවට තොරතුරු පළ කරති.

රටේ ප්‍රදේශ කිහිපයක පුළුල් හානියක් සිදු කළ මෑත කාලීන සුළි කුණාටුව සහ දරුණු වර්ෂාවෙන් පසුව සයිබර් අපරාධකරුවන් සහන සහ ප්‍රතිසාධනකටයුතුවල නියැලී සිටින රජයේ ආයතන සහ සංවිධානවල නම් වංචනික ලෙස අනුකරණය කර ඇත. ඔවුන් රැවටිලිකාර සබැඳි (Links) බෙදා හරින අතර මෙම සබැඳි හරහා මුදල් පරිත්‍යාග කිරීමට මහජනතාව පොළඹවන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ වින්දිතයින්ට ඔවුන්ගේ බැංකු ගිණුම්වලින් සෘජුවම අරමුදල් අහිමි වේ.

සැක සහිත සබැඳි මත ක්ලික් නොකරන ලෙසත්, පුද්ගලික තොරතුරු බෙදා නොගන්නා ලෙසත්, නොදන්නා පුද්ගලයින් හෝ සත්‍යාපනය නොකළ වෙබ් අඩවි සමඟ බැංකු තොරතුරු හෝ එක් වරක් භාවිතා කළ හැකි මුරපද (OTP) කිසි විටෙකත් හෙළි නොකරන ලෙසත් Sri Lanka CERT මහජනතාවට තරයේ මතක් කර දෙයි.